ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

<u>හින්දි භාෂාව හදාරන ශ්‍රී ලාංකික සිසු සිසුවියන් **35** දෙනෙකු සඳහා ඉන්දියාවේ**දී** හින්දි භාෂාව හැදෑරීම සඳහා පූර්ණ ශිෂ්‍යත්ව පිරිනැමේ</u>

ඉන්දිය රජයේ ශිෂ්‍යත්වයක් යටතේ ඉන්දියාවේදී හින්දි භාෂාව හැදෑරීම සඳහා ශ්‍රී ලාංකික සිසු සිසුවියන් 35 දෙනෙකු තෝරා ගෙන ඇත. 2025 අගෝස්තු සිට 2026 මැයි දක්වා අග්‍රා හි කේන්ද්‍රීය හින්දි සංස්ථාන් හෙවත් මධ්‍යම හින්දි ආයතනයේ පැවැත්වෙන මෙම නව මාසික පාඨමාලාව සඳහා සහභාගීවන සිසු සිසුවියන්ගේ ගුවන් ගමන්, අධ්‍යයන ගාස්තු සහ දේශීය ආගන්තුක සත්කාර වියදම් සඳහා ඉන්දිය රජය අනුග්‍රාහකත්වය ලබා දෙයි.

2. 2025 ජූලි 28 වන දින ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා ඉන්දියාවට පිටත් වීමට නියමිත මෙම සිසු පිරිස හමු විය. එතුමා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සහස්‍ර වර්ෂ ගණනාවක් පුරා පවතින සංස්කෘතික, භාෂාමය, සාහිත්‍යමය සහ ආගමික බැඳීම් සව්මත් කිරීමෙහිලා හින්දි භාෂාවේ සහ සාහිත්‍යයේ භූමිකාව අවධාරණය කළේය. හින්දි සහ සිංහල වචන අතර පවතින සම්බන්ධතා සහ වචනවල මූලාරම්භයන් පිළිබඳව ද සාකච්ඡා කරන ලදී. මහ කොමසාරිස්තුමා ඉන්දියාව බලා පිටත් වන සිසු සිසුවියන් වෙත සිය සුබ පැතුම් ද පිරිනැමුවේය.

3. තෝරාගන්නා ලද සිසු පිරිසට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දාහත් දෙනෙකු, කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයෙන් සහ අනුරාධපුර රජරට විශ්ව විද්‍යාලයෙන් සිව් දෙනෙකු බැගින්, කැළණිය විශ්ව විද්‍යාලය සහ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයෙන් දෙදෙනෙකු බැගින් ඇතුළත් වූ අතර සෙසු පිරිස සබරගමුව විශ්ව විද්‍යාලයෙන් සහ බෞද්ධ අධ්‍යාපන ආයතනවලින් තෝරා ගෙන තිබිණ.

4. ශ්‍රී ලංකාවේ සිසු සිසුවියන් සහ ජනතාව හින්දි භාෂාවට මහත් සේ ඇලුම් කරන අතර ප්‍රධාන පෙළේ පාසල් සහ විශ්ව විද්‍යාල ඇතුළු ආයතන 100ක පමණ හින්දි භාෂාව ඉගැන්වේ. 2025 ජූලි මාසයේදී අග්‍රාහි හින්දි ආයතනයේදී ශ්‍රී ලංකා රජයේ පාසල් ගුරුවරුන් 35 දෙනෙකු සඳහා විශේෂ පුහුණු වැඩසටහනක් ද පවත්වන ලදී.

5. ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය 2011 වසරේ සිට මෙම ශිෂ්‍යත්වය

සම්බන්ධීකරණය කරයි. පසුගිය වසර 13 තුළ ශ්‍රී ලාංකික සිසුන් 200කට අධික පිරිසකට "හින්දි භාෂාව විදේශයන්හි ප්‍රචලිත කිරීම" යන තේමාවෙන් යුත් මෙම ශිෂ්‍යත්වය පිරිනමා ඇත. මෙම වසරේදී මෙම ශිෂ්‍යත්වය සඳහා වැඩිම සිසු පිරිසක් තෝරා ගන්නා ලද්දේ ශ්‍රී ලංකාවෙනි. හින්දි භාෂාව, සාහිත්‍යය සහ සිනමාව ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ඉපැරණි ශිෂ්ටාචාරමය සබඳතා වඩාත් ශක්තිමත් කිරීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි.

***

කොළඹ
*2025 ජූලි 28*